# යේසුස් ප්‍රේම කරයි
# යේසුස් පිහිට වෙයි



# යේසුස් ප්‍රේම කරයි - යේසුස් පිහිට වෙයි

''වෙහෙස වන, බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න; මම (යේසුස්) ඔබට සහනය දෙමි.'' (මතෙව් 11:28)



''දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයානන් (යේසුස්) වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය.''(යොහාන් 3:16)

"හිමි තුමන්ට කන්නලව් කළ එක් අසරණයෙක් විය; එතුමාණෝ (යේසුස්) ඔහුගේ බස් අසා, සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක." (ගීතාවලිය 34:6)

''එතුමාණෝ (යේසුස්) සිය වදනින් ඔවුන් සුවපත් කළ සේක. ඔවුන් මරණින් ගොඩගත් සේක.'' (ගීතාවලිය 107:20)

''කිසි කලෙක මම (යේසුස්) නුඹලා අමතක නොකරන්නෙමි.''(යෙසාය 44:21)

''හිමි තුමන් (යේසුස්) ගුණවත් බව ඔබ ම අත්දැකීමෙන් දැනගන්න.''(ගීතාවලිය 34:8)

''මවක ඇගේ දරුවා සනසන්නාක් මෙන් මම (යේසුස්) නුඹලා සනසන්නෙමි.'' (යෙසාය 66:13)



‘’යේසුස්ක්‍රිස්තුන්වහන්සේ ඊයෙත්
අදත් සදහටමත් ඒකාකාර ම ය.’’
(හෙබ්‍රෙව් 13:8)

‘’මාර්ගය ද සත්‍යය ද ජීවනය
ද මම (යේසුස්) වෙමි; මා මගින්
මිස කිසිවෙක් පියාණන් වහන්සේ
වෙත නොපැමිණෙන් නෝ ය.’’
(යොහන් 14:6)

‘’මනුෂ්‍ය-පුත්‍රයාණෝ
(යේසුස්) නැතිවූ දේ සොයන්නට ද
ගළවාගන්නට ද වැඩම කළ සේක’’ (ලූක් 19:10)

‘’උන්වහන්සේ (යේසුස්) පිළිගත් සියල්ලන්ට එනම්,
උන්වහන්සේගේ නාමය අදහාගත් අයට, දෙවියන්
වහන්සේගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්
වහන්සේ දෙවා වදාළ සේක.’’ (යොහාන් 1:12)

‘’උන්වහන්සේගේ (යේසුස්ගේ) පූර්ණතාවෙන් අපි
සියල්ලෝ ම වරප්‍රසාද පිට වරප්‍රසාද ලැබීමු.’’ (යොහාන් 1:16)

‘’ එහෙත්, එතුමන්(යේසුස්) තුවාළ ලැබුවේ අපේ
අපරාධ නිසා ය; පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය.
එතුමන් ලත් දඬුවමින් අපට සාමදානය ලැබී ඇත; එතුමන්
ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත.’’ (යෙසාය 53:5)

‘’යහපත් එඬේරා මම (යේසුස්) වෙමි. යහපත් එඬේරා,
තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේ ය.’’
(යොහාන් 10:11)

‘‘පසුතැවී සිත් හරවා ගන්න; ස්වර්ග රාජ්‍යය ආසන්න ය’’(මතෙව් 4:17)

‘‘ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අදහා ගන්න. එවිට ඔබ ගැළවෙන්නෙහි ය; ඔබ ද ඔබේ ගෙයි වැසියෝ ද ගැළවෙන්නාහ’’(ක්‍රියා 16:31)

‘‘පියාණන් වහන්සේ මට දෙන සියල්ලෝ ම මා වෙතට පැමිණෙති; මා වෙතට පැමිණෙන්නා මම කිසි සේත් ඉවත නොදමමි.’’(යොහාන් 6:37)

‘‘ඔහු මට ප්‍රේම කරන්නේ නම්, මම (යේසුස්)ඔහුට විමුක්තිය දෙන්නෙමි. ඔහු මාගේ නාමය පිළිගන්නේ නම්, මම ඔහු රැකගන්නෙමි.’’(ගීතාවලිය 91:14)



‘‘මා (යේසුස්) ගොස් ඔබට ස්ථානයක් සූදානම් කළ විට, මා සිටින තැන ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි.’’ (යොහාන් 14:3)

‘‘ පාපයේ විපාකය මරණය යි, එහෙත් දෙවියන් වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ සදාතන ජීවනය යි.’’ (රෝම 6:23)

‘‘අප අනාථ ව සිටිය දී ම ක්‍රිස්තුන් වහන්සේ පව්කාරයන් උදෙසා නියමිත කාලයේ දී සිය දිවි පිදූ සේක.’’ (රෝම 5:6)

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මීට වසර දෙදහසකට පමණ පෙර මෙලොවට වැඩිය සේක. එතුමන් සෑම ජනයන්ටම යහපත කරමින් සෑම ආකාරයකම රෝග සුව කළසේක. දේවරාජ්‍යය පිලිබඳ ශුභාරංචිය දේශනා කළසේක. උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථානවී අද ජීවමානව වැඩසිටින සේක. උන්වහන්සේ ඊයෙත්, අදත්, සදහටමත් ඒකාකාරමය. අදටත් උන්වහන්සේ තමන්වෙතට පැමිණෙන සෑම ජනයාටම යහපත කරන සේක.





## යාඥාව:

"යේසුනි, මම ඔබට ප්‍රේම කරමි. මගේ පව් කමා කර මාගේ රෝග සුවකළ මැනව. මට සමාදානයත්, විවේකය සහ සතුටත් දුන මැනව. මට සදාකාලික ජීවනය දී මා ආශීර්වාද කළමැනව. ආමෙන්."

